Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 5

ශ්‍රේණිය - 12

සකස් කළේ- ඩබ්. දයානන්ද මයා - ර/ධර්මාලෝක ම.වි.

නිපුණතාව 1- ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 1.5 - සම්පත් බෙදා වෙන් කිරීම හා නිමැවුම බෙදා හැරීම පිළිබඳ තීරණ ගන්නා ආකාරය විග්‍රහ කරයි.

## <u>මූලික ආර්ථික ප්‍රශ්න -</u>

සමාජයක් සතු සම්පත් සම්භාරයේ ඇති හිඟකමත් සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීමත් නිසා සෑම සමාජයක්ම තේරීමේ ප්‍රශ්නයකට මුහුණ දේ .ඒ අනුව සෑම සමාජයකටම මූලික තේරීම් තුනක් කිරීමට සිදු වේ.ඒවා මූලික ආර්ථික ප්‍රශ්න ලෙස හැඳින්වේ.ඒවා නම්,

1.කුමක් කොපමණ නිපදවන්නේද?
සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ ප්‍රශ්නය

2.කෙසේ නිපදවන්නේද?
භාවිතා කරන ශිල්ප ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය

3.කා සඳහා නිපදවන්නේද?
නිෂ්පාදිතය බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්නය/ආදායම් බෙදී යාම පිළිබඳ ප්‍රශ්නය

## <u>අභ්‍යාස</u>

1.කුමක් කොපමණ නිපදවන්නේද යන ප්‍රශ්නයෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

2.සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා යෝග්‍ය ශිල්ප ක්‍රම දෙක නම් කර පැහැදිලි කරන්න.

3.කා සඳහා නිපදවන්නේද යන ප්‍රශ්නය ආදායම් බෙදී යාම පිළිබඳ ප්‍රශ්නයක් ලෙස හඳුන්වන්නේ ඇයි?